# කලාව හා තාත්විකවාදය

සනත් නානායක්කාර

අතිශයෝක්තිය පැරණි කලාවන්වල ඇති විශේෂ ලක්ෂණයක් බව එම කලාවන් හදාරණ කාහට වුවද වැටහේ. අතිශයෝක්තිය ඇති තැන තාත්විකත්වයක් තිබිය නොහේ. තාත්විකත්වය කලාවන්වල අවශ්‍යයෙන්ම තිබිය යුතු ලක්ෂණයක් ලෙස සැලකෙන්නට පටන් ගත්තේ ඉතා මෑතක සිටය. පැරණි චිත්‍රයක් ගෙන බලන්න. එහි නොයෙක් දේ දක්වා තිබෙන්නේ, එය අප ඇසට හමුවන අන්දමට නොවේ. ස්ත්‍රියකගේ රූපයක් චිත්‍රයට නඟන සිත්තරා, එම චිත්‍රයේ ඇස් ඉතා දිගට දක්වයි. ඉඟටිය ඉතා සිහින් ලෙස දක්වයි. අත් පා රන්ලතාවන් ආකාරයෙන් දක්වයි. බුදුරුව ගෙන බලන්න. එහිද අපට දක්නට ඇත්තේ අතිශයෝක්තියෙන් චිත්‍රයට නඟන ලද ලක්ෂණ සමූහයකි. මෙය ලංකාවේ කලා ශිල්පවලට පමණක් සීමාවුණු ලක්ෂණයක් නොවේ. ලොව සෑම තැනම පාහේ එක් අවදියක, අතිශයෝක්තිය පිළිගත් අලංකාරය ලෙස සැළකුණි.

සිංහල ගද්‍ය හා පද්‍ය කෘතිවලද මේ ලක්ෂණය බහුල ලෙස දක්නට ඇත. පැරණි ගී කාව්‍යයක් හෝ පද්‍ය කෘතියක් ගෙන බලන්න. එම කෘතිවල එන වර්ණනා, චරිත ආදිය දක්වා ඇත්තේ අතිශයෝක්තියෙනි.

තාත්විකත්වය සෑම කලාවකම අවශ්‍යයෙන්ම තිබිය යුතු ලක්ෂණයක් ලෙස සැලකෙන්නට පටන් ගත් තැන් සිට, අතිශයෝක්තියට කලාවේ තිබුණු තැන අහිමි විය.

කලාව ජීවිතය පිළිබිඹු කරන්නක් විය යුතුය යන හැඟීම ප්‍රචලිත වන්නට, එය තාත්වික විය යුතුය. නොඑසේ නම්, එය ජීවිතය ඇති සැටියෙන් ම දැක්විය යුතුය යන හැඟුමද සීඝ්‍රයෙන් පැතිරෙන්නට විය. අතිශයෝක්තියෙන් ජීවිතයේ නියම තතු පෙන්විය නොහැකි බැවින්, කලාවෙන් එම අලංකාර ක්‍රමය ඉවත් කළ යුතු බව හැඟෙන්නට ඇත. කලාව තාත්විකත්වයෙන් යුක්ත විය යුතු යැයි අදහස් කෙරුණේ කලාව නියම මග ගෙන යන අදහසින් විය යුතුය.

නමුත් තාත්වික වාදය කලාවට ඈඳා ගැනීම, කලාව නියම මග ගෙන යෑමට උපකාරී වීද යන්න සැක සහිතය. කලාව හා තාත්වික වාදය, එකිනෙක ගැලපිය හැකි අදහස් දෙකක් නොවේ. කලාවක් බිහි වන්නේ කලාත්මක ලෙස තාත්විකත්වයෙන් ඈත් වූ විටය. යම් කිසිවක් කෙලින් දැක්වෙන තැන කලාවක් බිහි නොවේ. කෙලින්ම දැක්වීම කලාවක් නම්, පත්‍රයේ පලවන වාර්තා කලාත්මක නිර්මානයන් විය යුතුය. හැම ඡායා රූප ශිල්පියෙකු විසින්ම ගනු ලබන ඡායාරූප

කලාත්මක බවෙන් පරිපූර්ණ විය යුතුය. නමුත් නියම තතු දක්වමින් පත්‍රයේ පලවන වාර්තාවක් කලාව ලෙස නොගැණේ. මෝටර් රියැදුරකුගේ බලපත්‍රයේ ඇලවීම සඳහා, කිසියම් ඡායාරූප ශිල්පියෙක්, එම රියැදුරාගේ ඡායාරූපය නියම ලෙස ගතහොත්, එය කලාත්මක වටිනාකමකින් යුක්ත වූවක් ලෙස නොසැලකේ. මෙය තාත්වික නමුත්, කලාවක් නොවේ.

කලාව ජීවිතය උදෙසා සකස් විය යුතු බව, සිත් තුල කාවැදීම නිසා, එය ජීවිතයේ නියම තතු නියම ආකාරයෙන් දැක්වීමට යොද ගැනීමට සිතෙන්නට ඇත. කලාව තාත්විකවීම, වරදක් ලෙස මෙයින් නොහඟිමි. කලාව තාත්වික විය යුතුය. නමුත් ''තාත්වික'' යන පදයේ අර්ථය හොඳින් වටහා ගැනීම ඉතා අවශ්‍යය.

තාත්වික යන පදය සාමාන්‍ය ව්‍යවහාරයෙහි යෙදෙන විට ගැබ්වන අරුතට වඩා වෙනස් අරුතක් එය කලාව හා සම්බන්ධ වන විට ඇති වේ. කලා නිර්මානයක් තාත්වික විය යුත්තේ කලාත්මක ලෙසය. නළුවෙක් දක්ෂ ලෙස දරපලන්නෙකුගේ චරිතය නිරූපණය කරනවා යැයි සිතමු. එම චරිත නිරූපණය දුටු එක් තැනැත්තෙක්, එම මිතුරකුට එම නළුවා දක්ෂ කලාකාරයෙකු ලෙස හඳුන්වා දෙයි. නමුත් මිතුරා කිසිම පිළිතුරක් නොදී, පෙර කී ලෙස පුද්ගලයාත් කැටුව අසළ ඇති දරමඩුවක් ලඟට ගොස් එහි දර පලන්නකු දක්වා, ඔහු වඩා දක්ෂ කලාකාරයකු බව පවසයි.

තාත්වික යන පදයේ සාමාන්‍ය අරුත මත පිහිටා නම් මෙබඳු නිගමනයකට බැසීම යුක්ති-යුක්තය. නමුත් , කලාත්මක කෘතියක හෝ කලාත්මක නිශ්පාදනයක තිබිය යුතු තාත්විකත්-වය ගැන සිතන විට නම්,මෙය මුළුමනින්ම වැරදි නිගමනයකි. නූතන යුගයේ රචකයින් බොහෝ විට නොමග යාමට හේතුවන්නට ඇත්තේද තාත්විකත්වය පිළිබඳව මෙබඳු හැඟීමක් ඇති කරගත් නිසා විය හැකිය. දරමඩුවක චෙතනය පිණිස දර පලන්නෙක්, කලාකාරයෙකු නොවන බව අපි දනිමු. කලාවක් බිහිකිරීමට හෝ චරිත නිරූපණයක් කිරීමට හෝ ඔහු එවිට කිසිසේත් නොසිතයි. කලාව, නිතැතින්ම බිහිනොවන්නක් බව සිතා ගත යුතුය. මේ බවද අප බොහෝ විට අමතක කර ඇත. කලාත්මක කෘතියක් බිහිකිරීමට කලාකරුවා, කිසියම් ආයාසයක් දැරිය යුතුය. සිදුවුණු කිසියම් සිද්ධියක් ගෙන, එය කපා, කොටා සකස් කිරීමෙන්, ඔහු එයට කලාත්මක බවක් ආරූඪ කිරීමට තැත්කරයි. එම සිද්ධිය ඇතිසැටියෙන්ම දැක්වුණි නම්, එහි කලාත්මක බවක් දක්නට ලැබෙන්නේ නැත. එහෙයින් කලාත්මක කෘතියක් බිහිකරන විට හෝ කලාත්මක නිශ්පාදනයක් ඉදිරිපත් කරන විට හෝ, තමා එය කලාත්මක ලෙස ඉදිරිපත් කරන්ට යන බව සිහියට නගා ගතයුතුය. එවිට එය හුදු තාත්විකත්වයෙන් ඈත්විය යුතු බව එක්වරටම අවබෝධ වේ.

පෙර සඳහන් කෙරුනු නළුවා, තම කාර්යය, සීමා අතික්‍රාන්ත අතිශයෝක්තියෙන් හෝ හුදු තාත්විකත්වයෙන් හෝ නොකරයි. නළුවා හා දරමඩුවක දර පලන මිනිසා අතර ලොකු පරතරයක් තිබේ. ඒ පරතරය ඇත්තේ නළුවා, කලාත්මක ලෙස හුදු තාත්විකත්වයෙන් ඈත් වී ඇති ආකාරය නිසාය. මෙසේ සලකන කල, කලාව හා සම්බන්ධ වූ විට, ''තාත්වික'' යන පදය, ඉන් සාමාන්‍යයෙන් දැක්වෙන අරුතට වඩා ගැඹුරු අරුතක් ප්‍රකාශ කරන බව තරයේ සිතා ගත යුතුය. පහත දැක්වෙන කවි බලන්න.

පෙර මින් කඳුළු කිරි දරුවෙකු අතේ     දරා
පෙර ලා නොගොස් පෙම්බර මව්පියන්     කරා
ද ර දඩු ගැහුණ අතපය හාමතේ     දිරා
න ර කාදියක හිමියනි අද යසෝ     දරා

කු ම රකු සමග තෙමි තෙමි කඳුලැලි     වැස්සේ
බි ම පෙරළෙමින් ඉකි බිඳ ඇඬුවට     පස්සේ
ම ම හිමිසඳුනි ගිය අවුරුදු හය     තිස්සේ
මෙම පඩි පෙළෙන් නැහැ තව එළියට     බැස්සේ

පෙම බර බිසව සහ පුතුනුද රුවින්     හෙබි
අ ම තක කෙරුව හැටියට බුදු බවක්     ලැබී
ම ම හිමියනේ ඇඬුවා මිස කඳුළු     බිබී
මෙම කවුළුවෙන් වට පිට නොබැලුවෙමි     එබී

මෙම කව්වලින් කෙරෙන්නේ ශෝකය කෙලින්ම කීමකි. එහෙයින් එය හුදෙක්ම තාත්විකය. නමුත් එය කිසිසේත් තාත්වික නොවේ. ශෝකය අප්‍රියය දනවයි. රචකයා කළ යුතුව තිබුණේ ශෝක රසය, කරුණා රසය බවට පත්කොට ඉදිරිපත් කිරීමයි. එසේ කිරීමට නම්, තම ශෝකය වක්‍ර ක්‍රමයකින් කියා පෑ යුතුමය.

තෙමා වැටේ මගෙ සළුපිළි නෙත් පුර වා
අ මා රසක් වැනි හිමි සඳ සිහි වෙන වා
ද මා කුමරු වැඩියා මට සිහිවෙන වා
මෙමා ඇර ලියෝ ලෙව් තුළ ඇද්ද ත වා

උන්නෙමු අපි ඉපිද ලෙහෙනුන් කුලේ එ ද
වැටුණේ ජලය මැද සමුදුරයේ බිලි දා
දුනුනේ කරපු විරිය ගොඩ ගන්ඩ එ ද
හිමි රජුනේ මග ඇරියේ මන්ද මෙ ද

රුව ඇති පුතුන් වැදුවා මම වැරදී ද
රුව ගුණ තේජසක් මගෙ අඩු වුණා ව ද
ගරු සරු නැතිකමක් මාතින් යෙදුණා ද
මරු බිඳ බුදුවෙන්ට සිතෙන් පෙනුණා ද

මෙය තම ශෝකය කෙලින්ම කියා පෑමක් නොවේ. වක්‍ර ක්‍රමයකින් කියා පෑමකි. එහෙත් එය කලාත්මක ලෙස තාත්විකය. මෙහි පිළිගත නොහැකි කිසිදු අදහසක් ඇද්ද? මෙහි කිසිවක් අතිශයෝක්තියෙන් දක්වා ඇද්ද? මෙය තාත්වික නොවේද? මෙහි කර ඇත්තේ ශෝකය කෙලින්ම නොකියා වක්‍ර ක්‍රමයකට කීමය.

සමහර විටෙක කිසියම් සිද්ධියක් ඇත්ත වශයෙන්ම සිදු වූ වක් විය හැකිය. නමුත් එහි තාත්වික බවක් නොතිබෙන්නට පුළුවන. තවත් සිද්ධියක් ඇත්ත වශයෙන් සිදු නොවූවද, තාත්වික ලෙස හැඟෙන්නට පුළුවන. තාත්වික යන්නෙන් අදහස් කෙරෙන්නේ සිදු වූ බවක් නොවේ. සිදුවිය හැකි බව පමණකි. නමුත් මෙය කලාතුරකින්, කිසියම් දෛවයෝගයකින් සිදුවන්නක් නම්, එය කලාත්මක තාත්විකත්වයක් ඇතිව ඉදිරිපත් කළ නොහේ. සිදුවූව හෝ සිදුවිය හැකි, එහෙත් අභව්‍ය නොවන දේ තාත්වික ලෙසත්, කලාත්මක ලෙසත් ඉදිරිපත් කළ හැකි ය.

කලාකරුවා කිසිවක් කලාත්මක ලෙස ඉදිරිපත් කරන්නේ කෙසේද? තමන් ඉදිරිපත් කිරීමට යන දේ ගැන හොඳ අදහසක් ඇතිකර ගැනීම අත්‍යවශ්‍යය. ඉන්පසු කලාකරුවා කළ යුත්තේ තමන් ඉදිරිපත් කිරීමට අදහස් කරන දෙයෙහි, වඩාම කැපී පෙනෙන ලක්ෂණ තෝරා ගැනීමය. එම ලක්ෂණ ඔහු සමහර විටෙක මඳක් අතිශයෝක්තියෙන් දක්වයි. අතිශයෝක්තිය, අවලක්ෂණයක් වන්නේ එය සීමාව ඉක්මවා ගිය විටය. සීමාවන් තුළ පිහිටා කලාත්මක බවෙන් හෝ තාත්වික බවෙන් හෝ ඈත් නොවී, අතිශයෝක්තිය අලංකාරයක් ලෙස උපයෝගී කොට ගත හැක. සමහර විටෙක කලාකරුවා කිසියම් ලක්ෂණයක් ඇති ආකාරයට වඩා මඳක් විකෘතකොට දක්වයි. මෙය කළ හැක්කේ තමන් දක්වන දේ වක්‍ර ක්‍රමයකින් දැක්වීමෙනි. රස දනවිය හැක්කේද, අදහස් වක්‍රෝක්තියෙන් දැක්වීමෙන් පමණය. සුළු අදහසක් වුවත් කෙලින්ම, ඇති සැටියෙන්ම, කියනවාට වඩා වක්‍රෝක්තියෙන් කීමෙන් කලාත්මක ලෙස දැක්විය හැක. පහත දැක්වෙන යෙදුම බලන්න. ''මල පරවුණා.'' මෙයින් කියවෙන අදහසට වඩා සාරවත් අදහසක් ''මල මැරුණා'' යන යෙදුමෙන් කියවේ. ''මැරුණා'' යන පදය යෙදීමෙන්, මලට ප්‍රාණයක්ද ඇතුළත් වේ. මෙය වක්‍රෝක්තිය හා අතිශයෝක්තිය යොදා ගැනීමෙකි. නමුත් තාත්වික බවෙන් ඈත් වී නැති බව පැහැදිළිව පෙනේ.